ශ්‍රේණිය 07

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- නාට්‍ය හා රංග කලාව I

පාසලේ නම : ..............................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය - 02 යි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරන්න.**

01. සෙල්ලම් ගෙදර නිර්මාණය තුලින්
    1. සෙල්ලම් කිරීමට පුරුදු වෙයි
    2. පන්ති කාමරය සෙල්ලම් ගෙයක් ලෙස නිර්මාණය කරයි
    3. නාට්‍යමය ලක්ෂණ හඳුනා ගනියි
    4. සෙල්ලම් ගෙවල් සෑදීමට උත්සහ කරයි

02. ස්වභාවික පරිසරයේ වස්තුන්ගේ ඇති හැඩතල වර්ණ භාවිත කළ හැක්කේ,
    1. පසුතල නිර්මාණයන්ට ය
    2. රූපණයට ය
    3. රංගාලෝකණයට ය
    4. වේෂ භූෂණයට ය

03. වේදිකා නාට්‍ය හා විද්‍යුත් මාධ්‍ය අතර ඇති සමානතාවයක් වන්නේ
    1. සජීවී ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම
    2. එක දිගට විකාශය වීම
    3. නියමිත වේලාවක් සහ දිනයක් තිබීම
    4. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් වීම

04. විද්‍යුත් මාධ්‍යයෙන් විකාශනය වන නාට්‍ය පිළිබඳ වැඩසටහනක් වන්නේ.
    1. රංග භූමි
    2. ශනිදා
    3. අටපට්ටම
    4. පුංචි පැංචි

05. කතාන්දරයකින් නාට්‍ය පෙළක් ලිවීමේදී
    1. සියලුම සිද්ධීන් සම්බන්ධ කරගත යුතු ය
    2. සියලුම චරිත සම්බන්ධ කරගත යුතු ය
    3. තෝරාගත් සිද්ධි පමණක් ඇතුළත් කළ යුතු ය
    4. ගැටුම් අවස්ථා පමණක් ඇතුළත් කළ යුතු ය

06. නළුවකු හෝ නිළියක විසින් විවිධ වූ චරිත නිරූපණයේදී
    1. චරිතයක එක් පැතිකඩක් පමණක් නිරූපණය කළ යුතුය
    2. චරිතයට ආවේණික ලක්ෂණ නිරූපණය කළ යුතුය
    3. චරිතයේ බාහිර සමාරෝපය ඉස්මතු කළ යුතුය
    4. තමාට දැනෙන හැඟීම් ප්‍රකාශ කළ යුතුය

07. නාට්‍යයකදී යොදා ගන්නා නාට්‍යෝපකරණ
    1. සංකීර්ණ අයුරින් නිර්මාණය කළ යුතුය
    2. සාමාන්‍ය උපකරණ ම භාවිතා කළ යුතුය
    3. සාමාන්‍ය පරිහරණ භාණ්ඩ වලට යොදා ගන්නා අමු ද්‍රව්‍යම යොදා ගත යුතුය
    4. පෙළෙහි අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නිර්මාණ කළ යුතුය

08. ආනුෂංගික කලාවක් යොදා ගන්නේ
    1. වේෂ භූෂණ පෙන්වීමට
    2. රංගය වඩා පැහැදිලි වීමට
    3. නළු නිළියන් කැපී පෙනීමට
    4. විනෝදයක් ලබා ගැනීමට

09. සංවාද භාවිතයේදී සැලකිලිමත් විය යුත්තේ
    1. අධික ශබ්දයෙන් යුතුව සංවාද කියවිය යුතුය
    2. අපැහැදිලි හඬකින් සංවාද කියවිය යුතුය
    3. එක දිගටම සංවාද කියවිය යුතුය
    4. අදහස් ප්‍රකාශ වන සේ හඬ උස් පහත් කරමින් සංවාද කියවිය යුතුය

10. විවිධ නාද අනුකරණයේදී සැලකිලිමත් විය යුත්තේ
    1. විවිධ නාද පිළිබඳ මනාව ගවේෂණය කළ යුතුය
    2. විවිධ නාද ඇසෙන ප්‍රදේශ පිළිබඳ සොයා බැලිය යුතුය
    3. විවිධ නාද හඬ උස් පහත් නොකොට ශබ්ද කළ යුතුය
    4. සත්වයන්ගේ හඬ නාද අනුකරණයට සුදුසු නැත

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වගුව ඇසුරින් පිළිතුරු තෝරන්න.**

| A | B | C | D | E |
|---|---|---|---|---|
| දෝන කතිරිනා | මහා වංශය | දේවිකුමරිය | දළදාගමනය | නම්පොත |
| සුබ සහ යස | දීප වංශය | ගජබා රජු | සිරිපැරකුම් | බුද්ධගජ්ජය |
| ගජමන් පුවත | රාජරත්නාකරය | පණ්ඩුකාභය | මහින්දාගමනය | සකස්කඩ |

11. ඓතිහාසික කතා ඇසුරින් නිර්මාණය වූ චිත්‍රපට ඇතුලත් වන්නේ
   1. B  2. E  3. D  4. A

12. හඬ අභ්‍යාස සඳහා යොදා ගත හැක්කේ
   1. E  2. A  3. C  4. D

13. ඓතිහාසික කතා ඇසුරින් නිර්මාණය වූ වේදිකා නාට්‍ය ඇතුලත් වන්නේ
   1. C  2. D  3. E  4. A

14. ඉතිහාස කතා පිලිබද තොරතුරු ඇතුළත් ග්‍රන්ථ ඇතුළත් වන්නේ
   1. B  2. C  3. D  4. E

15. දේශය පිළිබඳ කැපවීමකින් කටයුතු කළ රටට හිතැති චරිත ඇතුළත් වන්නේ
   1. A  2. C  3. D  4. B

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට හරි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද යොදන්න.**

16. චලන ක්‍රියා පමණක් නොව විවිධ නාද සහ හඬ ද අනුකරණය කල හැකිය ( )
17. වෙස් මුහුණු නිර්මාණය සඳහා ලි වර්ග පමණක් භාවිතා කරයි. ( )
18. කය සහ මනස අතර සම්බන්ධතාව වර්ධනය කර ගැනිමට සංචලන අභ්‍යාස කළ යුතුය. ( )
19. නාට්‍ය නිර්මාණයේදි පරිකල්පනය බොහෝ සේ වැදගත් වේ. ( )
20. ශිථිලකරණ අභ්‍යාස කිරිමෙන් සිරුර අලස ස්වභාවයට පත් වේ. ( )

(2×20=40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. ''අමර ගියා දිව්‍ය ලොකේ'' නාට්‍ය ආශ්‍රයෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   I. ''අමර ගියා දිව්‍ය ලෝකේ'' නාට්‍යය කාගේ නිර්මාණයක්ද? (ලකුණු 02)
   II. මෙම නාට්‍යයෙහි ඇති ළමා නාට්‍ය ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   III. මෙහි එන සත්ත්ව චරිතයක් සහ අධිමානුෂිය චරිතයක් නම් කරන්න. (ලකුණු 02)
   IV. අමර යහපත් මාර්ගයට ගැනිමට යොදා ගන්නා උපක්‍රමය කුමක්ද? (ලකුණු 02)
   V. අමරට දිව්‍ය ලෝකේ එපා වුණේ ඇයි? (ලකුණු 02)
   VI. මෙම නාට්‍යයෙන් ලබා ගත හැකි ආදර්ශයක් ලියන්න. (ලකුණු 02)

02. I. නාට්‍යයක තේමාව යනු කුමක්ද? (ලකුණු 02)
   II. ඔබ දන්නා නාට්‍ය දෙකක් නම්කර එහි තේමාවන් ලියා දක්වන්න. (ලකුණු 04)
   III. ''සමගිය බලය වේ'' යන තේමාව යටතේ සුදුසු කතාවක් තෝරා ගෙන එයින් නාට්‍යයක් නිර්මාණය සදහා සුදුසු සිද්ධි පෙළගස්වන්න. (ලකුණු 06)

03. I. රංග භූමියක් යනු කුමක්ද? (ලකුණු 02)
   II. රංග භූමියක තිබිය යුතු ලක්ෂණ දෙකක් නම් කරන්න (ලකුණු 04)
   III. එළිමහන් සහ ගෘහස්ථ රංග භූමි දෙක බැගින් නම් කර ඔබ කැමති රංග භූමියක් ඇද දක්වන්න. (ලකුණු 06)

04. I. අභිනය යනු කුමක්ද? (ලකුණු 02)
   II. අභිනය කොටස් හතර නම් කරන්න. (ලකුණු 04)
   III. අනුෂාංගික අංග අයත් අභිනය නම් කර එයින් නාට්‍යයට ඇති ප්‍රයෝජන 04 ක් ලියන්න. (ලකුණු 06)

05. I. වේෂ භූෂණ යනු මොනවාද? (ලකුණු 02)
   II. වේෂ භූෂණ නිර්මාණයේදි සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් නම් කරන්න. (ලකුණු 04)
   III. ඔබ කැමති චරිතයක් සදහා සුදුසු වේෂ භූෂණ ඇද වර්ණ ගන්වන්න. (ලකුණු 06)

06. I. වෙස් මුහුණු පැළද රංගනයේ යෙදෙන ජන නාටක දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   II. රංගනයේදි වෙස් මුහුණු පැළදීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)
   III. ඔබ පන්ති කාමරයේදි නිර්මාණය කළ වෙස් මුහුණ සකස් කළ අයුරු පියවර වශයෙන් ලියන්න. (ලකුණු 06)

07. I. සිරිත් මල්දම කෘතිය කියවීමෙන් අපට ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   II. වැඩ ඇති විට අතපසු නොකරන්නේ
   අද දවසට වැඩ අද කරපන්නේ
   ..........................................................................................
   ..........................................................................................
   මෙහි ඉතිරි කවි පද දෙක සම්පුර්ණ කරන්න. (ලකුණු 04)
   III. ඉහත කවිය ඇසුරින් නාට්‍යයකට සුදුසු කතාවක් නිර්මාණය කරන්න. (ලකුණු 06)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න